# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2153/4 - 2019 දෙසැම්බර් මස 09 වැනි සඳුදා - 2019.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : POL/HGD/LND/13/56/005.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/9/216/පීආර්ඩී/453.

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි දෙවැනි වගන්තියේ පළමුවැනි උපවගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් මට කරන ලද නියමය පරිදි, මෙහි පහත විස්තර කර තිබෙන ප්‍රදේශයෙහි පිහිටි ඉඩමක් මහජන කාර්යයක් සඳහා වුවමනා වී තිබෙන බව එකී වගන්තියේ දෙවැනි උපවගන්තියේ ප්‍රකාර මහජනයාට දැනුම් දෙමි.

මහජන කාර්ය කුමක්ද යන්න : මින්නේරිය ප්‍රදේශයට ඉන්ධන පිරවුම්හලක් ලබාදීම සඳහා ඉඩම් කොටස් අත්කර ගැනීම.

ඉහත කී ප්‍රදේශයේ විස්තර : උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ මින්නේරිය ගමේ පිහිටි සර්වෙයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක PO/HKD/2019/127 හා 2019.08.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 00736 ක් පමණ වන පටපිළිකන්ද කැලේ නැමති ඉඩම් කොටස.

මායිම් :

උතුරට : 4 සහ 7 වැනි බිම් කැබලි; නැගෙනහිර : 7 වැනි බිම් කැබැල්ල; දකුණට: 7 සහ 194 වැනි බිම් කැබලි; බටහිර: 194, 161 සහ 4 වැනි බිම් කැබලි.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 නොවැම්බර් මස 30 වැනි දින හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 නොවැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයක් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබද ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ආර්.එම්.ඩී.පී.පුෂ්පකුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
හිඟුරක්ගොඩ.

12-800